රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 14/88

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1988 අප්‍රියෙල් මස 25 වැනි දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
රාජ්‍ය සංස්ථා සභාපතිවරුන් වෙත.

අවතැන් වූ රාජ්‍ය නිලධරයන් හා සංස්ථා සේවකයින් නැවත
සේවය ඇරඹීම.

ජාතිවාදී කෝලාහල නිසා අවතැන් වී නැවත රාජකාරියට වාර්තා කිරීමට ඉල්ලා සිටින රජයේ නිලධාරියෙකු, පළාත් පාලන සේවයේ සේවකයෙකු හෝ රාජ්‍ය සංස්ථා සේවකයෙකු හෝ තමා සේවය කළ දෙපාර්තමේන්තුවෙහි ප්‍රධානියා/රාජ්‍ය සංස්ථාවෙහි සභාපති වෙත තමන්ට සේවයට නොපැමිණීමට තුඩුදුන් කරුණු පැහැදිලි කර වාර්තා කළයුතුය. දෙපාර්තමේන්තු ප්‍රධානියා/සංස්ථා සභාපති ඒ ඒ අභියාචනයට අදාල කරුණු අනුව සලකා බලා, නිලධාරියාට/සේවකයාට රාජකාරියට නැවත වාර්තා කිරීමට ඉඩදිය යුතුද, නැත්ද යන්න තීරණය කළයුතුය.

02. රාජකාරියට නැවත වාර්තා කිරීමට ඉඩදිය හැකි බවට තීරණය කරන ලද නිලධාරියෙකුට/සේවකයෙකුට, නොපැමිණි කාලසීමාව සඳහා පහත දැක්වෙන අන්දමට නිවාඩු ලබා ගැනීමට අවසර දියයුතුයි.

(I) ප්‍රස්තුත වර්ෂයේ පාවිච්චියට නොගත් අනියම් හා විවේක නිවාඩු ද,
(II) පූර්වාසන්න වර්ෂයේ පාවිච්චියට නොගත් විවේක නිවාඩු ද,
(III) තම සේවාකාලය තුළදී පාවිච්චියට නොගත් පසුගිය ඕනෑම වසර දෙකක විවේක නිවාඩු ද (ඉතුරු නිවාඩු),

පාවිච්චි කරමින් ඉතිරිවන යම් කාලයක් වේ නම්, එය වැටුප් රහිතව නිවාඩු ලබාගත යුතුය.

03. 1983 ජූලි සිට ජාතිවාදී කෝලාහල හේතුවෙන් මියගිය හෝ තුවාලයෙන් ආබාධිත වූ රජයේ නිලධාරියෙකුට, පළාත් පාලන සේවයේ සේවකයෙකුට හෝ රාජ්‍ය සංස්ථා සේවකයෙකුට, අංක 296, 343, 351 සහ 369 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල සඳහන් විධිවිධාන අදාල විය යුතුය.

04. අනාරක්ෂිත බව සහ කෝලාහල වලට බියෙන් සේවයෙන් ඉල්ලා අස්වීම නිසා හෝ සේවය අත්හැරයාම නිසා හෝ 1983 ජූලි මසට පසුව රැකියාව අහිමි වූ රජයේ නිලධාරියෙකු, පළාත් පාලන සේවයේ සේවකයෙකු හෝ රාජ්‍ය සංස්ථා සේවකයෙකු හෝ විශ්‍රාම ගැනීම සඳහා මනාපය පලකරමින් ඉදිරිපත් කරන ඉල්ලීමක් ඒ එක් එක් අවස්ථාවට බලපාන කරුණු අනුව සලකා බැලිය යුතුය. ඊට ඉඩදීම සුදුසු බවට ඔහු පුද්ගලිකව සෑහීමට පත්වේ නම්, සේවය කළ වසර ගණන නොසලකා, විශ්‍රාම ගැනීමේ මනාපයට ඉඩදීමේ බලධරයා අදාල අමාත්‍යාංශයේ ලේකම්වරයා වේ.

Siriwardhana

(ඩී.බී.අයි.පී.එස්.සිරිවර්ධන)
ලේකම්
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.